# ගීතය, ආනන්දයෙන් ප්‍රඥාවට

**ආචාර්ය විශාරද දයාරත්න රණතුංග**
**(PHD – Music Therapy)**

ගීතයක් වෙත අප සවන් දොරටු විවර වන්නේ "රස" වින්දනය සඳහාය.

"රස" යනු දඹදිව කලා විචාරයෙහි හා සෞන්දර්ය විද්‍යාවෙහි කලා රසාස්වාදය, සෞන්දර්යානුභූතිය හෙවත් චමත්කාරානුභූතිය හඳුන්වනු පිණිස යෙදෙන පාරිභාෂික පදයයි. මෙසේ හැඳින්වෙන රසය, අප සාහිත්‍යයේදී නව රසයක් බවට පරිවර්තනය වේ.

සාහිත්‍යයේ හා නාට්‍යයේ පැවත එන නව රසය සංගීතයේදී වඩාත් පවුල ලෙස ව්‍යාප්තවේ. ගීතයේදී ගේය පද හෙවත් බහරසජ් නැමැති ගීත සාහිත්‍ය පක්ෂය විසින් රස වින්දනය සඳහා කිසියම් මනෝ භාවයක් හෙවත් අරමුණක් කරා ශ්‍රාවකයාගේ සිත මෙහෙයවයි. පද නිර්මාණයෙන් මවන්නට උත්සුක වන චිත්‍රය රසාත්මක බවට පත්වන්නේ සංගීතය හෙවත් ගී තනු නිර්මාණයෙනි.

ගීත නිර්මාණයක් සාර්ථක වන්නේ වස්තු විෂය කෙටිවූ සන්දර්භයක්, මධුරවූ ගීත ස්වරයෙන් වර්ණවත්ව, ධ්වනි පූර්ණ කටහඬකින්, අප සවන්පත් කරා ගලා එන විටදීය. මෙහිදී තනු නිර්මාණයට සුවිශේෂ ස්ථානයක් හිමිවේ. අප ඇතැම් විට හින්දි ගීත, ඒවායේ පදමාලා වල තේරුම් හරියාකාර අවබෝධ කර නොගෙන වුවත් ඒ තනු කෙතරම් ආශාවකින් වැළඳ ගන්නේද? එවැනි නාද මාලා අප නිතැතින්ම මුමුණමින් රස විඳින අවස්ථා කෙතරම්ද? තනු නිර්මාණයේ ප්‍රබල ශක්තිය අවබෝධ කර ගැනීමට මෙය හොඳ නිදසුනකි.

ජෝශප් හේඩින් (Joseph Heyden) නම් අපරදිග සංගීත විචාරකයා මෙසේ පවසයි.

"It is the melody which is the charm of music, and it is that which in most difficult to produce. The invention of a fine melody is a work of genius."

"සංගීතයේ චමත්කාරය තනුවයි. තනුවක් නිර්මාණය කිරීම ඉතා අපහසු ක්‍රියාවකි. මධුරතර තනුවක් නිර්මාණය කිරීම මහා ප්‍රාඥයෙකුගේ කාර්යයකි."

මේ අදහසම වරක් රවීන්ද්‍රනාත් තාගෙ ෝර් ප්‍රකාශ කළේ මේ ආකාරයටයි

"Why should the song accept the slavery of words? The song can exist by itself. It can express any feeling without words."

"ගීතය වචනයට වහල් වන්නේ ඇයි? ගීතයට තනිවම ජීවත්විය හැකියි. එයට වචන නොමැතිව ඕනෑම භාවයක් ප්‍රකාශ කළ හැකියි"

ගීතය පිළිබඳව මෙවැනි දාර්ශනික මත ඔස්සේ සිත යොමු කිරීමේදී ගායන ශිල්පී ශිල්පිනින් හා සංගීත නිර්මාණ ශිල්පීන්ගෙන් ඉටුවිය යුතු කාර්යය ඉතා විශාල බැව් පසක්වේ.

නව පරපුරේ ගායක ගායිකාවන්ගේ සරළ ගීත බොහෝ සෙයින් පද පෙළට සීමාවූ තනු වලින් ආවරණය වූ ඒවා යැයි පිළි ගැනේ. ඇතැම් ගීත ඡායාරූප රාමු වැනියැයි වරක් විචාරයකයෙකු පැවසුවේ ඒ නිසා වන්නට ඇත. ඡායාරූපය රාමුව තුළ සිරවී ඇත. දිනපතා වුවද ඒ දෙස බලන විට පෙනෙන්නේ එකම ඉරියව්වකි. කිසියම් වෙනසක් නොපෙනේ, එහෙත් කලා කෘතියක් ආස්වාදනයේදී ඒ තුලින් නව සුවඳක් ආඝ්‍රාණය විය යුතුය. සන්දේශ කාව්‍යවල කියවුනා සේ "නොව පැරණිය වන රමණිය විටින් විට" යන සංකල්පය කලා කෘතියක් පුරා පැතිරිය යුතුවේ. ගීතයක් වුව සාර්ථක කලා කෘතියක් බවට පත්වන්නේ එවිටය.

බොහෝ සෙයින් ශ්‍රී ලංකාවේ එළිමහන් රංග පීඨවලදී ඉදිරිපත් කෙරෙන සංගීත ප්‍රසංගවල ගැයෙන ගීත මානසික සුවය කෙරෙහි යොමුවේද යන්න ගැටළුවකි. ඇතැම් ගීතවලින් ශ්‍රාවකයන් ලබන්නේ මානසික රසයක් නොව භෞතික රසයක් බැව් ඒ අයගේ හැසිරීමෙන් පැහැදිලි වේ. සංගීත සංදර්ශනයක් අවසානයේ ශ්‍රාවකයින් හට මානසික සහනය වෙනුවට විඩාවට පත්වන්නේ නම් ඉන් ඇති ප්‍රයෝජනය කුමක්ද?

මැද පෙරදිග එක්තරා රටකදී අප විසින් ඉදිරිපත් කළ "උදුම්බරා" සංගීත ප්‍රසංගයේදී සුවිශේෂ සිද්ධියක් වීය. ඉදිරි අසුන්වල සිටි ප්‍රේක්ෂකයින් කිහිපදෙනෙකු මත්පැනින්




සන්තර්පනය වී සිටි අතර, තරමක වේග රිද්මයෙන් යුතුවූ ගීත (කිරිකවඩි සිනා, උදුම්බරා, උපුලී, සඳ මා හා, ප්‍රේම ත්‍රිකෝණය, රාධා ක්‍රිෂ්ණා) ගායනයේදී ඔවුහු ඉදිරියට පැන නටන්නට වූහ. පසු පෙළවල මානසික සහනය අපේක්ෂා කරමින් සිටි අයට

"නිව්යෝක්" නගරයේදී "උදුම්බරා" ප්‍රසංගයේ මා "දුරස්වන්නට මේ ලෙසින්" ගීතය ගයන විට ප්‍රේක්ෂක සභා ගැබේ දෙකෙළවරින් ඉල්ලීම් රැගත් කුඩා කොළ කැබලි මා අත පත්වීය."මේ ගීතය කරුණාකර නැවත ගයන්න" යන ඉල්ලීම සඳහන් කළ අකුරු දෙවර්ගයකි. එකක් තරුණියකගෙ ' බවත් අනෙක තරුණයකුගේ බවත් පැහැදිලි වීය. මම නැවතත් ගායනා කළෙමි. ප්‍රසංගය අවසානයේදී වේදිකාවට පැමිණි තරුණ යුවළක් එදා විවාහ වූවාක් මෙන් ප්‍රීතිමත් සිනහවෙන් යුතුව මගේ දෙපා නැමද "අප මෙතෙක් වෙන්වී ඉඳල අද ඔබගේ ගීතය නිසා එක් වුණා" යැයි පවසන විට මගේ දෑසට සතුටු කඳුළු ඉනුවේ මා විශාල පිනක් කරගත් බැව් පසක් වීමෙනි.

මෙම නැටීම මහත්වූ බාධාකාරී වාතාවරණයක් වීය. සංදර්ශනය අවසානයේදී බොහෝ දෙනෙකුගේ ඉල්ලීම වූයේ ඊට පසු දිනම සුරාව තහනම් කළ වෙනත් රඟහලක නැවත "උදුම්බරා" ප්‍රසංග ය පැවැත්විය යුතු බවයි.

බුද්ධිමත් ශ්‍රාවකයින් නොමැති තැන හොඳ කලාකරුවන් බිහිවන්නේ නැත. එසේම හොඳ කලාකරුවන් නොමැති තැන බුද්ධිමත් ශ්‍රාවකයින් බිහිවන්නේ නැත. බුද්ධිමත් ශ්‍රාවකයින් බුද්ධිමත් කලාකරුවන් හට මහත්වූ ආශිර්වාදයකි. සංවිධායකයින්ගේ විශේෂ ඉල්ලීම පරිදි පසුදින ඉදිරිපත් කළ "උදුම්බරා" සංගීත ප්‍රසංගයේදී ශ්‍රාවක රසවතුන් මෙන් අපද ලැබුවේ උපරිම සතුටකි.



අපගේ "උදුම්බරා" ප්‍රසංගය ඉදිරිපත් කරන විට ගයනු ලබන ගීත පිළිබඳව පැහැදිලි කිරීම අප විසින්ම ඉදිරිපත් කිරීම අපගේ සිරිතයි. එම ගීවල නිර්මාණ පක්ෂය, රචනා කෙරුණු ආකාරය, පසුබිම් වුණු අත්දැකීම් ආදියද මෙම විස්තරවලට ඇතුලත් වේ. මෙවැනි විස්තරාත්මක හැඳින්වීමකින් පසුව ගීයක් ගැයීමේදී ශ්‍රාවක රසිකයින් ඒවාට සවන් දෙන්නේ මනසේ සකසා ගත් චිත්‍රයක් විවිධ පැහැයන්ගෙන් වර්ණවත් වන ආකාරයෙනි. එබැවින් එවැනි අවස්ථාවලදී ශ්‍රාවකයන් උපරිම වින්දනයක් ලබනවා අපි දුටුවෙමු.

"නිව්යෝක්" නගරයේදී "උදුම්බරා" ප්‍රසංගයේ මා "දුරස්වන්නට මේ ලෙසින්" ගීතය ගයන විට ප්‍රේක්ෂක සභා ගැබේ දෙකෙළවරින් ඉල්ලීම් රැගත් කුඩා කොළ කැබලි මා අත පත්වීය."මේ ගීතය කරුණාකර නැවත ගයන්න" යන ඉල්ලීම සඳහන් කළ අකුරු දෙවර්ගයකි. එකක් තරුණියකගේ බවත් අනෙක තරුණයකුගේ බවත් පැහැදිලි වීය. මම නැවතත් ගායනා කළෙමි. ප්‍රසංගය අවසානයේදී වේදිකාවට පැමිණි තරුණ යුවළක් එදා විවාහ වූවාක් මෙන් ප්‍රීතිමත් සිනහවෙන් යුතුව මගේ දෙපා නැමද "අප මෙතෙක් වෙන්වී ඉඳල අද ඔබගෙ ' ගීතය නිසා එක් වුණා" යැයි පවසන විට මගේ දෑසට සතුටු කඳුළු ඉනුවේ මා විශාල පිනක් කරගත් බැව් පසක් වීමෙනි.

ලොස් ඇන්ජලීස් නුවරදී "මහ රෑ යාමේ මේ ඇල් හේනේ" ගීතය මා මහාචාර්ය අමරා රණතුංග සමඟ ගයා අවසන් වනවාත් සමඟම තව වරක් ගයන්නැයි ඉල්ලීම් කිහිපයක් විය. නැවත වරක් ඒ රසික සභාව පිනවීමට ගායනා කෙළෙමු. ප්‍රසංගය අවසානයේදී වේදිකාවට පැමිණි රසවතුන් අතරින් මැදිවිය ඉක්මවූ යුවළක් ඉතා රසවත් කතාවක් අපට කියා අප සමඟ විනෝද වුනු ආකාරය අපට අමතක නොවේ. මෙම යුවළ විවාහ වෙන්නට පෙර ඉතා තරුණ අවධියේදී ජීවත්ව සිටියේ අනුරාධපුර නගරයට ආසන්න ගම්මානයකය. ගොවිතැන් කළ ඔවුන්ගේ දෙමව්පියෝ යමක් කමක් ඇති අය බැව් ප්‍රකාශ වීය. හොඳ අධ්‍යාපනයක් ලැබූ මෙම තරුණයා හා තරුණිය අතර ප්‍රේම සම්බන්ධතාවය ඇතිවූයේ පැසුණු ගොයම් කරලින් පිරුණ සශ්‍රීක ගොයම හා එහි තනාගත් පැල ආශ්‍රිතවයි. වර්තමානයේ ලොස් ඇන්ජලීස් නුවර හොලිවුඩ් පුරවරයේ ජීවත් වුවත් එදා ලංකාවේ පිටිසර ගම්මානයේ වින්ද සුන්දරත්වය ගීතය තුළින් නැවත සිහියට නැගෙන විට ආපසු ලංකාවට යන්නට සිතුනා යැයි ඔවුහු අප සමඟ ප්‍රකාශ කළහ.

භාරතීය රස සූත්‍රයේ සඳහන් පරිදි "විභවානුභාව ව්‍යභිචාරී සංයෝගාද් රස නිෂ්පත්තිඃ" යනුවෙන් ප්‍රකාශ වන්නේ කලා කෘතියක් රස වින්දනයට ගෝචර වනසේ සකස් වන අයුරුයි. කලා කෘතිය ගීතයක් වන අවස්ථාවේදී ගේය පද පෙළණී ඊට උචිත නාද මාලාව, ඒ ඒ අවස්ථාවන් නිරූපනය කෙරෙන ආකාරයෙන්, කටහඬ පාලනය හා මධුරතාවය රැක ගැනීම, හඬේ උස් පහත් භේදය, ස්වර තුළින් ඉස්මතුවන තීව්‍රතාවය, කෝමළතාවය ආදී විවිධ ගුණාංග රාශියකි. අවසාන ඵලය වන සාර්ථක ගීත රසාස්වාදයකට යොමු වන්නේ මෙකී කරුණු සාර්ථකව සුසංයෝගීව ඉදිරිපත් වුවහොත් පමණි.

මේ සියළු අංග තමාගේ ක්‍රමවේදය මගින් ශ්‍රාවක සහෘදයන් ඉදිරියේ පුද කරන්නේ කලා කෘතියක ස්වරූපයෙනි. මෙම කාර්යයේදී කලාකරුවා හෙවත් ගායකයා හෝ ගායිකාව කෙතරම් වගකීම් සම්භාරයක් දරන්නේද? ඒ විශ්වාසනීයත්වය දැරීමට කලාකරුවා තුළ කෙතරම් ශික්ෂණයක් තිබිය යුතුද? එසේනම් ප්‍රබුද්ධ ගායකයෙකු හෝ ගායිකාවක් වීම කෙතරම් භාස්කමක්ද?

ප්‍රබුද්ධ ශිල්පියෙකු හෝ ශිල්පිනියකුගේ කාර්යය විය යුත්තේ ජීවන අත්දැකීම් කලා කෘතියක් මගින් සෞන්දර්යාත්මකව ඉදිරිපත් කරමින් ඒ තුලින් ශ්‍රාවකයාගේ ජීවිතය හැඩගැස්සවීමය. විරෝධාකල්ප ගීවලින් හා සටන්කාමී ගී මගින් සිත් සතන් අවුලට පත් කිරීම කලාකරුවෙකුගේ යුතුකම නොවේ. කලාකරුවාගේ යුතුකම සිත් සමනය කිරීමයි.

මනාවූ ගායකයෙකු, ගායිකාවක් තුළ දාර්ශනිකයෙකු ජීවත්වේ. සියුම්වූද උපක්‍රමශීලීවූද, එහෙත් කාරුණිකවූද හදවතක් ඇති පුද්ගලයෙකු ජීවත්වේ. තමුන් විඳින රසය නිර්ලෝභීව අනුනගේ රසයට උල්පතක් වීමට ශක්තියක් ඇති භවතෙකු ජීවත්වේ. රස භාව හඳුනන මිනිසෙකු ජීවත්වේ. මේ සියල්ලටම වඩා විශාල සිත් සතන් සංඛ්‍යාවක් එක් වර ප්‍රබෝධමත් කිරීමට වෙර දරන පින්වතෙකු ජීවත්වේ.